## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.06.10 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 ජූනි මස 10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | |
|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එම්.ප්‍රදීපා ඉදුම්ණී කුලරත්න මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ආර්.තිෂෝක් මැතිතුමා |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | එච්.ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ජී.ඉන්දික කුමාර මැතිතුමා |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - | ඩබ්.ඉන්දික උදය කුමාර ගුණවර්ධන මැතිතුමා |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද, මාධ්‍යවේදී මහතාද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 01.2026.05.13 මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.

2026.05.13 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

සභාවෙන් ගන්නා තීරණ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග හා ප්‍රගතිය සම්බන්ධව යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට දැනුම් දීමක් සිදු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදී.

### 02. සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන

පසුගිය මස ඇතුළත වෙසක් සතියක් පැවැත්වූ බවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් වෙසක් සතිය පැවැත්වීම සම්බන්ධව මහපෙන්වීම යටතේ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය එක්ව පාසල් 02ක් මුල් කර ගනිමින් විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැඩසටහන් දෙකක් මාරපන විද්‍යාලයේ හා පාතකඩ බෞද්ධ විද්‍යාලයේ පැවැත්වූ බවත්,ඊට අමතරව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවක මණ්ඩලය හා ඒකාබද්ධව බස් නැවතුම්පළ පිරිසිදු කිරීමක් සිදු කළ බවත්,පහල බෝපිටිය විහාරස්ථානයෙන් සංවිධානය කළ වෙසක් බැති ගී වැඩසටහන සඳහා සම්බන්ධ වී මන්ත්‍රීවරුන් හා නිලධාරීන් එක්ව බැති ගී ඉදිරිපත් කිරීමක් සිදු කළ බවත්,ඒ සම්බධයෙන් ස්තූතිය පුද කරන ලදී. ප්‍රාදේශිය සභාවෙන් සිදු කරන වැඩසටහන් දේශපාලනයෙන් සිදු කරන වැඩ සටහන් නොව එය ප්‍රාදේශීය සභාවෙන්

සිදු කෙරෙන කාර්යයක් බැවින් මෙම වැඩසටහන් සඳහා ගරු මන්ත්‍රී වරුන්ගේ සම්බන්ධ වීම අපේක්ෂා කරන බවත් පවසන ලදි.

දැනට අප සතුව පවතින වාහන අතරින් ඉතා පැරණි වාහන අප සතුව ඇති බවත්,මේ වන එක් ට්‍රැක්ටර් රථයක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පවතින බවත්,වාහන කිහිපයක්ම අබලං තත්වයේ පවතින බැවින් මෙම සේවාවන්හී දුර්වලතා මේ දින වල සිදු විය හැකි බවත්,කළට වේලාවට වාහන සහ අනෙකුත් පහසුකම් සම්බන්ධයෙන් ගැටළුකාරී වෙන්න පුළුවන් බවත් දන්වා සිටින ලදි.

ප්‍රාදේශීය සභා සීමාව තුල ඩෙංගු රෝගී වැඩි පිරිසක් සිටින හෙයින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා ප්‍රාදේශී සභාව ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක වන බවත්,බැරුණ්ඩුව හා වැලිමළුව කොට්ඨාශ වල වැඩසටහන් ක්‍රියාත්මක බවත්,ස්ථාන නිරීක්ෂණය කර දැනුවත් කිරීමක් සමඟ නඩු පැවරීමක් සිදු කරන බවත්,මේ වන විට නඩු 30ක් විතර අරගෙන ඇති බවත් ඉදිරියේදී මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ වලට පැමිණීමට හැකි බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් දන්වන ලදි.

රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අනුමත කුට්ටපිටිය වත්තෙ පංගුව පාලම ඉදි කිරීම ව්‍යාපෘතියට ටෙන්ඩර් කමිටුව ලෙස 2026 වර්ෂයේ ජනවාරි මස 14 දින මහා සභා තීරණ අංක 02ට අනුව පත් කළ ප්‍රසම්පාදන කමිටුව යොදා ගන්නා බව දන්වා සිටිමි.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025 දෙසම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් තත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇති බව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

පෙ.ව.10.20ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

බැරුණ්ඩුව කොට්ඨාශය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා පෞද්ගලික හේතුවක් මත මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වී ඇති බවත්, මීට පෙර සමඟි බලවේගයේ ගරු මන්ත්‍රී තුමිය ඉල්ලා අස්වූ බවත් සභාවට දැනුම් දෙන ලදි.

1987 ප්‍රාදේශීය සභා පනත නිර්මාණය කිරීමෙන් පසු එහි විශාල වැඩ කොටසක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට පැවරී තිබෙන බැවින් ලංකාවේ ප්‍රාදේශීය සභා පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් විශාල පිරිසක් දේශපාලන කාර්යයයේ නිරත වෙන බවත්,ප්‍රාදේශී සභා මන්ත්‍රීවරයෙක් වුනත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකු වුනත් එක සමාන තත්වයකට කාර්යය භාරයන් පැවතී ඇති බවත්,රු.15,000.00ක වැනි වේතනයක් නොව දීමනාවක් ලැබෙන බවත්, මන්ත්‍රී වරුන් වරියන් සමාජයේ ජීවත් වන පිරිසක් ලෙස බලන විට දේශපාලඥයා යන පුද්ගලයාට සියලු වැඩ කටයුතු ඉලක්ක වී ඇති බැවින් සමාජයේ විවිධ අවස්ථාවන් සඳහා ආරාධනා ලැබෙන බවත්, තමන්ගේ වියදමින් එම අවස්ථාවන්ට සහභාගී වීමට සිදුවෙන බව හා අවස්ථාවන්හිදී මූල්‍ය දායකත්වය ලබා දීමට සිදු වෙනවා.මේ තත්වය මත මන්ත්‍රීවරුන්ට ගැටළුකාරී තතවයන්ට මුහුණ දීමට සිදු වේ.එම නිසා මාගේ පෞද්ගලික මතය වී ඇත්තේ මීට වඩා දීමනාවක් ලැබිය යුතු බවය.ඒ අනුව සභාවේ අදහස් රැගෙන මෙම දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ යෝජනාවක් ලෙස පළාත් පාලන අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කිරීමට අදහස් කරන බවත්,පරිපාලන ආයතන වෙත යොමු විය යුතු ප්‍රශ්න මන්ත්‍රීවරයෙකුට පැමිණීමේ ප්‍රවනතාවක් පවතින බව හා ආපදා අවස්ථාවකදී වුවද මුලින්ම දැනුවත් කරන්නේ මහජන නියෝජිතයන්ටය. එය ජන මනස තුල පැවති විකෘතියක් බවත්,ඊට අදාළ ආයතන ,දෙපාර්තමේන්තු,සංස්ථා,මණ්ඩල,ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන්ට පුහුණු, වැටුප් ,ආයතන,සම්පත් ලබා දුන්නත් මෙම ගැටලු යොමු වන්නේ මන්ත්‍රීවරුන්ට බවත්,මෙය සමාජයේ දැනුවත්භාවයෙන් තොර බැවින් බවතින තත්වයක් බවත්,අපට ගැටලු විසඳිය හැක්කේ ප්‍රාදේශීය සභා පනතට අනුකූලව බවත්,මෙය නිවැරදි විය යුතු බවත්,ඒ තත්වය තුල ලැබිය යුතු දීමනාව වැඩිවිය යුතු බවත්,ඉල්ලා අස්වූ මන්ත්‍රීවරුන් දෙපලට තමන්ගේ ශ්‍රමය ධනය කැප කර සභාවට පැමිණ ලබා දුන් සහය වෙනුවෙන් කෘතඥ වන බවත් ප්‍රකාශ කරන ලදි.

පොලොන්නරුව අනුරාධපුරය වැනි පළාත් පාලන ආයතනයක් ගත් කළ ඔවුන් මාර්ග හා සංවර්ධනයන් සිදු කළ විට එම සංවර්ධනයන් දීර්ඝකාලීනව පවතින බවත් නැවත නැවත එම සංවර්ධනයන් සිදු කිරීමට සිදු නොවන බවත්,අප වගේ පළාත් පාලන ආයතනයක් ලෙස සංවර්ධනය කරන මාර්ග නිරතරයෙන් කැඩීමක්,බහිනවා,වළවල් හැදෙනවා,එවිට වෙනත් පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරන එක් සංවර්ධනයක් අපි නිතර නිතර සිදු කිරීම සිදු වන බවත්,පතල් කර්මාන්තය නිසා මාර්ග වලට හානි දායක තත්වයක් පවතින බවත්,පළාත් පාලන ආයතනයක දියුණුව මනින විට අපට ඉතා අවාසිදායක තත්වයක් පවතින බවත්,එක පාරක් නිතර නිතර සංවර්ධනය කිරීම සිදුවේ.උදාහරණයක් ලෙස පනාවැන්න මාර්ගයක් අඩි 150ක් 200ක් පමණ සම්පූර්ණ වළවල් හැදිල ගිලා බැසීමක් සිදු වෙලා තිබෙන බවත්,මේ ළඟදී තවත් කොටසක් ගිලා බැස ඇති බවත්,එතනින් එහා ටික අද ඊයේ හැදුවා වගේ පවතින බවත්, පාර දෙපැත්තෙ එක වළක්වත් නැති බවත්,මෙයට හේතුව විමසීමේදී එම ස්ථානයේ පතල් කැපීමක් සිදු කර ඇති බවත්,එවිට මාර්ගය ගිලා බැසිමකට ලක්වී ඇති බවත්,මෙම පතල් සම්බන්ධයෙන් ගමේ කෙනෙකුවත් විරුද්ධ වී නොමැති බවත්,එම ගමේම පුද්ගලයන් මෙම මාර්ගය සංවර්ධනය කිරීමට ඉල්ලීම් කරන බවත්,මෙය පළාත් පාලන ආයතනයක් ලෙස අප මුහුණ දෙන අර්බුධයක් බැවින් මන්ත්‍රීවරු ලෙස මෙම කටයුත්තේදී සෘජුව කටයුතු කළ යුතු බවත්,කිසියම් ව්‍යාපාරයක් මඟින් අපගේ සම්පත් වලට හානියක් සිදු වනවානම් නොපමාව සභාව දැනුවත් කරන ලෙසත් එවිට එම කාර්යය නැවැත්වීමක් සිදු කළ හැකි බවත්,නැතිනම් එකම කාර්යයට මහජන මුදල් වියදම් භාවිතා කිරීමට සිදු වන බවත් පවසන ලදි

දැනට පවතින සිව් අවුරුදු (2022-2026) උපාය මාර්ග සැලැස්ම 2026 වසරින් අවසන් වේ.වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ මධ්‍යකාලීන සැලසුම් සකස් කරන්නේද මෙම සිව් අවුරුදු ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්මට අනුවය.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වෙසෙන මහජනතාවගේ අවශ්‍යතා හා මහජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යයන් ප්‍රමුඛතාගත කරමින් ඒ වෙනුවෙන් ආයතනය තුළ පවතින අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරමින්ද ප්‍රාදේශීය සභාව තුළින් සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව අන්තර්ගත කරමින් මෙම සැලැස්ම සකස් කළ යුතුය.

ඒ අනුව 2027-2030 දක්වා වන උපාය මාර්ගික සැලැස්ම 2026.12.31 දිනට ප්‍රථම සකස් කළ යුතුව ඇත. ඒ සඳහා සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගත යුතුව ඇති බැවින් 2026.06.10 වන දින සභා වාරයෙන් පසුව මද වේලාවක් රැඳී සිටින ලෙස දන්වා සිටිමි.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

වෛද්‍ය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පෞද්ගලික හේතුවක් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා සභාවට නොපැමිණි අතර එතුමාගේ නිවාඩු අනුමත නොවිය.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

I. **ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01.මාරපන කාර්යාලයෙහි අක්කර බදු ලේඛනයෙහි අක්කර බදු අංක 36 යටතේ සඳහන් වන එස්.ජේ.ඇලිස්නෝනා නාමය ඉවත් කොට එහි වර්තමාන අයිතිකරු වන ආර්.ඒ.සී.ආර්.පෙරේරා නාමය ඇතුළත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් විමසූ අවස්ථාවේදී අක්කර බදු අංක 36 යටතේ සඳහන් වන එස්.ජේ.ඇලිස්නෝනා යන අය මිය ගොස් ඇති බවත්,ඒ අනුව ඔහුගේ පවුලේ අය ස්වකීය කැමැත්ත ප්‍රකාශ කර ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බවත්, ආර්.ඒ.සී.ආර්.පෙරේරා යනු දියණියකගේ ස්වාමි පුරුෂයා බවත්,ඔහු අක්කර බදු ලේඛනයෙහි වර්තමාන හිමිකරු ලෙස සංශෝධිත නාමය ඇතුළත් කරන ලෙස ඉල්ලීම් සිදු කර ඇති බවත්,වැඩි දුර අවශ්‍ය නම් විෂය හරහා විමසීමක් කළ හැකි බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පැහැදිළි කිරීමක් අවශ්‍ය බැවින් මෙම ගරු සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව.10.45)

විෂය නිලධාරී හරහා විමසීමක් සිදු කරන ලදි.

මෙම කාරක සභාව ගරු සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව.11.05)

**තීරණ අංක 01**

මාරපන කාර්යාලයෙහි අක්කර බදු ලේඛනයෙහි අක්කර බදු අංක 36 යටතේ සඳහන් වන එස්.ජේ.ඇලිස්නෝනා නාමය ඉවත් කොට එහි වර්තමාන අයිතිකරු වන ආර්.ඒ.සී.ආර්.පෙරේරා නාමය ඇතුළත් කිරීමට පෙර මෙම යෝජනාව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත යොමු කර විධිමත් අධීක්ෂණයක් සිදු කර ලබන සභාවාරය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය

02.පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා ගල්ලුලුවස්සාහේන ඉඩමෙහි අනවසර පදිංචි කරුවන් 08 දෙනාගෙන් තම භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය සඳහා වාර්ෂික බිම් බදු අය කර ගැනීම සඳහා තීරණයට ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගල්ලුලුවස්සාහේන මැනීමක් සිදු කළ බවත්,රූඩ් 03 පර්චස් 20ක් ලැබුණ බවත්,ඒ අනුව පුද්ගලයන් 08 දෙනෙකු පමණ ද්‍රවිඩ ,සිංහල,මුස්ලිම් අය නිවෙස් සාදාගෙන ජීවත් වන බවත්,ඒ අය කුණු දමන කාලයේදී කුණු දමන ප්‍රදේශය මහහැර බැවුම් ප්‍රදේශයේ ගෙවල් 08 සකසා ඇති බවත්,මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්හය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් විමසූ අතර එහිදී ඔහු පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදහස් ඉදිරිපත් කළ යුතු බැවින් ඊට ප්‍රථම අපගෙන් කරුණු 02ක් විමසූ බවත්,එනම් මෙම පදිංචි පුද්ගලයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ ඉඩම් පිහිටීම සම්බන්ධයෙන් සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බව හා ගරු සභාවේ අනුමැතිය ලිඛිතව අවශ්‍ය බවත්ය. බිම්බදු ලබා දීම සම්බන්ධයෙන් නොවිමසූ බවත්,මෙම අනවසර පදිංචි කරුවන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳ මාර්ගෝපදේශයක් විමසූ බවත්,අප සභාවක් ලෙස මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු බවත්,අපි සතුව පවතින සුසාන භූමි 64ක් ලැයිස්තු ගත වී ඇති බවත්,එයින් හතළිස් ගණනක්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව සතු බවත් ඒවා සභාවට පැවරීමක් සිදු කර නොමැති බවත් ඒවා මැන පවරා දීමක් ඔවුන් විසින් සිදු කළ යුතු බවත්,සමහර කොටස් පුද්ගලයන් විසින් අත්පත් කර ගෙන ඇති බවත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගත නොහැකි තත්වයකට පත්වී ඇත්තේ මෙහි නීත්‍යානුකූල බවක් නොමැති නිසාය.මෙම ගල්ලුවස්සාහේන ඉඩම 1958 නීත්‍යානුකූලව ලබා දුන් ඉඩමක් බවත්,මෙම ඉඩම් නිරවුල් කර ගැනීම අත්‍යවශ්‍ය බවත් එසේ නොමැති වුවහොත් ඉඩම් අහිමි වීමට පුළුවන් බවත්,මෙම ඉඩම් කොටස් බිම්බදු ලබා දුනහොත් සභාවට ආදායමක් ලැබිය හැකි බවත්,මොවුන් ඉවත් කිරීමට හැකියාවක් නොමැති බැවින් කිසියම් අවසානයක් දක්වා මෙම වැඩපිළිවෙල රැගෙන ගොස් අපේ කොටස වෙන් කරගෙන කුමක් හෝ වාණිජ වැඩකට අවසර ගෙන සිදු කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

මෙම ඉඩම සුසාන භූමියක් යටතේ පවරාගෙන ඇති බවත්,වෙනත් වැඩකට මෙම භූමිය යොදනවානම් පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.ස්ථිර පදිංචිය අවු.25ක් 30කට වැඩි ගෙවල් 08ක් මෙහි පවතින බවත්,අනවසරයෙන් හෝ වසර ගණනාවක් මොවුන් පදිංචි වී සිටින බවත්,අපි ප්‍රාදේශීය සභාවක් ලෙස මූලික අරමුණක් තමයි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ සුබ විහරණය, සෞඛ්‍ය පිළිබඳව අප වග කිවයුතුය.මොවුන් අනවසරයෙන් පදිංචි වී සිටියත් ඔවුන්ටත් එම පහසුකම් සැකසිය යුතුය.මේ වන තෙක් මේ භූමියෙන් ආදායමක් නොලැබුණ බවත්,අනවසර පදිංචි කරුවන් යන කෝණයෙන් බලා මොවුන් ඉවත් කිරීම සුදුසු නොවන බවත්,මෙම ගෙවල් සෑදීමට පෙර මොවුන් ඉවත් කළානම් ගැටළුවක් නොමැති බවත්,මේ වන විට මොවුන් පමණක් නොව පැල්මඩුල්ල බල ප්‍රදේශයේම අනවසර ඉදිකිරීම් ඇති බවත්,මේ සම්බන්ධයෙන් විකල්පයක් ලෙස මොවුන්ට වෙනත් ඉඩමක් ලබා දීමට හැකිනම් ගැටළුවක් නොමැති බවත්, මේ වෙලාවේ ඉල්ලා සිටින්නේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ,ඉඩම් අමාත්‍යවරයාගේ නිර්දේශ ලබා ගෙන මේ අයට සුදුසු විදියට බදු ගිවිසුම් මත සභාවට ආදායමක් එන ලෙසට මේ අයට ලබා දීම සුදුසුම ක්‍රමවේදය බවයි.අද මේ වන විට පැල්මඩුල්ලෙහි වසර ගණනාවක් අනවසර ඉදිකිරීම් සිදු කර භුක්ති විඳින බවත්,නැවත අලුතින් අනවසර ඉදිකිරීමක් සිදුවනවානම් ක්ෂණිකව මෙය නතර කළ යුතු බවත්,අවුරුදු ගණනාවක් මෙම ඉදිකිරීම් පවතිනවානම් ඒවාටත් එක හා සමානව ගිවිසුම් ගහල සභාවට ආදායමක් එන ලෙස කටයුතු කළ යුතුය.අවශ්‍ය වෙලාවක සංවර්ධන සැලැස්ම,නගර සංවර්ධන සැලැස්මට අනුගතව අනවසර ඉදිකිරීම් ඉවත් කර ගැනීමට ගිවිසුම්ගතව කටයුතු කරමු .RD එකේ වුනත් අනවසර ඉදිකිරීමකදී නිර්වන්දි ගිවිසුමක් අත්සන් කරනවා.ඔවුන් එකපාරට ඉදිකිරීම කඩා ඉවත් කරගන්නේ නොමැති බවත්,අවශ්‍ය අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඔවුන් කඩා ඉවත් කර ගත යුතුයි යන්න ගිවිසුම් වල සඳහන් වන බවත්,ඒ ආකාරයට අපිත් ගිවිසුම් ගත වී සභාවට ආදායමක් එන ලෙස ඔවුන්ට හිතේ සැකයක් නැතිව ජීවත් වීමට ක්‍රමවේදයක් සළසා දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මේ වෙලාවේ ඉල්ලා සිටින්නේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ,ඉඩම් අමාත්‍යවරයාගේ නිර්දේශ ලබා ගෙන මේ අයට සුදුසු විදියට බදු ගිවිසුම් මත සභාවට ආදායමක් එන ලෙසට මේ අයට ලබා දීම සුදුසුම ක්‍රමවේදය බවයි.අද මේ වන විට පැල්මඩුල්ලෙහි වසර ගණනාවක් අනවසර ඉදිකිරීම් සිදු කර භුක්ති විඳින බවත්,නැවත අලුතින් අනවසර ඉදිකිරීමක් සිදුවනවානම් ක්ෂණිකව මෙය නතර කළ යුතු බවත්,අවුරුදු ගණනාවක් මෙම ඉදිකිරීම් පවතිනවානම් ඒවාටත් එක හා සමානව ගිවිසුම් ගහල සභාවට ආදායමක් එන ලෙස කටයුතු කළ යුතුය.අවශ්‍ය වෙලාවක සංවර්ධන සැලැස්ම,නගර සංවර්ධන සැලැස්මට අනුගතව අනවසර ඉදිකිරීම් ඉවත් කර ගැනීමට ගිවිසුම්ගතව කටයුතු කරමු .RD එකේ වුනත් අනවසර ඉදිකිරීමකදී නිර්වන්දි ගිවිසුමක් අත්සන් කරනවා.ඔවුන් එකපාරට ඉදිකිරීම කඩා ඉවත් කරගන්නේ නොමැති බවත්,අවශ්‍ය අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඔවුන් කඩා ඉවත් කර ගත යුතුයි යන්න ගිවිසුම් වල සඳහන් වන බවත්,ඒ ආකාරයට අපිත් ගිවිසුම් ගත වී සභාවට ආදායමක් එන ලෙස ඔවුන්ට හිතේ සැකයක් නැතිව ජීවත් වීමට ක්‍රමවේදයක් සලසා දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

පසුගිය සභා වාරයකදී මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ බවත්,මෙම ලේඛනයෙහි රංජිත් නැමති තැනැත්තාගේ නාමය නොමැති බවත්,මොහු මෙම කොටසේ පදිංචිව සිටිය බවත් නාය යාම අවස්ථාවේදී බැකෝ කරන අවස්ථාවේදී එම නිවස යට වූ බවත්,මොවුන්ටත් සාධාරණයක් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

සුනිල් සොමරත්න මැතිතුමා දිගින් දිගටම ප්‍රකාශ කලේ මෙම භූමි කොටස් දිය යුතු බවයි.අවුරුදු තිස් ගණනාවක් සිදු නොකළ දෙයක් අපි සිදු කරන බවත්,එනිසා එතුමා අනාවබෝධීව අදහස් ප්‍රකාශ කර ඇති බවත්,අවුරුදු ගණනාවක් නොදීපු එක නිවැරදි කරමින් දීමට යන බවත්,අවුරුදු 08කට කලින් අනවසර පදිංදි ඒ ඉඩම එයාට නැතිවුණානම් එම භූමයේම ලබා දීමට සුදුසු තැනක් තිබෙනවානම් ඒක ලබා දීමේ ගැටළුවක් මතු වන බවත්,මන්ද තව කෙනෙකු කිව්වොත් මටත් මෙතන ඉඩමක් තිබුණ කියල එයාටත් අපට ඉඩමක් දීමට සිදු වන බවත්,මෙය සොයා බැලීමක් සිදු කළ යුතුය.මේ සියලු දෙනාම අනවසර පදිංචිකරුවන් එයාලට ඉඩම් දෙනකොට හරි අවබෝධයක් ලබාගෙන ඉඩම්

දිය යුතු බවත්,මීගහගොඩත් අනවසර පදිංචි කරුවන් සිටින බවත්,ඔවුන්ට ඉඩම් ලබා දීමේ කටයුත්ත කළ යුතුය බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා පවසන ලදි.

මෙම මිනිසුන්ට ඉඩම් පෙර ලබා දුන් බවත් ඔවුන් එම ස්ථානයේ අනවසරයෙන් පදිංචි වීම යතාර්ථය බවත්, අවුරුදු ගණනාවක් එතන හිටපු නිසාම තමයි අපි මෙම ඉඩම් දෙන්න කියන්නෙ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මෙම ගැටළුව අමාත්‍යවරයා දක්වා යොමු විය යුතු බවත්,එක එක වැඩසටහන් නිවාස දීමට ක්‍රියාත්මක වූ බවත්,පොදු ඉඩම් පරිස්සම් කර ගත්තෙ නැති බවත්,පොළ භූමියටත් මෙය සිදු වී ඇති බවත්,සභාපතිතුමා පෞද්ගලිකව මෙම මිණුම් කටයුතු වලට සම්බන්ධ වුන බවත්,එම මිනිසුන්ට සාධාරණයක් වන ලෙස නීත්‍යානුකූල පදනමින් අමාත්‍යවරයාට යොමු කර එම කටයුතු කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 02</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ CLG/AD/03/1/12 හා 2026.05.08 දිනැති ලිපියට අනුව පහත නම් සඳහන් පුද්ගලයන් පදිංචි භූමි ප්‍රමාණය අනුව නිශ්චිත මායිම් හඳුනාගනිමින් සකස් කරනු ලබන මිනින්දෝරු සැලැස්මක් මත පදනම්ව වාර්ෂික බිම්බදු යටතේ නේවාසික පදිංචිය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය යටතේ ලබා දීම සුදුසු බවත්,එම අනුමැතිය සමඟ අත්පත් කර ගැනීමේ විධි විධාන පරිදී අත්පත් කර ගත් මෙම භූමිය බිම්බදු යටතේ නිදහස් කිරීමට අනුමත කොටස නිශ්චිත දත්ත සහිතව නැවත ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර එක් එක් පුද්ගලයා වෙත නිශ්චිත කොටස් බිම් බදු ලබා දීමට අනුමැතිය ලබා ගත යුතු බවත්,එකී අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් එම භූමිය තුල එක් එක් පදිංචිකරුවන් භුක්ති විඳිනු ලබන බිම් ප්‍රමාණයන් වෙනුවෙන් රජයේ තක්සේරුවක් මත අදාළ පදිංචිකරුවන් වෙත වාර්ෂික බදු පදනමින් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | නම | පදිංචි කාලය | ඉඩම් ප්‍රමාණය (පර්චස්) |
|---|---|---|---|
| 01 | පී.එම්.එම්.හාලිර් මයා | වසර 27 | 13.8 |
| 02 | ජේමල්ඩීන් හමිදූ මොහොමඩ් කාසිම් මයා | වසර 30 | 3.4 |
| 03 | සිත්ති ජෙමල්දින් මිය ගොස් ඇති බැවින් ඇයගේ පුතා ලෙස මොහොමඩ් නිසාර් මයා එම නිවසේ ජීවත් වේ | වසර 27 | 1.4 |
| 04 | මොහොමඩ් සුවෛර් රිස්වික් නිසාර් මයා(පරීක්ෂා කරන අවස්ථාවේ නිවස වසා ඇත) | වසර 28 | 6.8 |
| 05 | පලයන්ඩි බේබි රාණි(පරීක්ෂා කරන අවස්ථාවේ නිවස වසා ඇත) | වසර 18 | 2.0 |
| 06 | මොහොමඩ් තාහිර් මන්සූර් මයා | වසර 25 | 11.5 |
| 07 | එස්.එම්.නන්දසිරි මයා | වසර 30 | 12.6 |
| 08 | ඩී.ඒ.පී.රෝහණ කුමාර මයා | වසර 10-15 | 6.5 |

03.ගල්ලෙපිට ආදාහනාගාර ඉඩමේ ප්‍රිමික්ස් අංගනය ඉදි කිරීම - ගල්ලෙපිට ආදාහනාගාරය පිහිටි ඉඩම ප්‍රධානය කිරීමේදී කොන්දේසියක් ලෙස එහි මූලික අරමුණින් වෙනත් කාර්යයකට යොදා ගැනීම වළක්වා ඇති හෙයින් ප්‍රිමික්ස් අංගනය එහි ඉදිකර ගෙන යාමේදී අතරමඟ නීතිමය බාධා මතුවේ.ව්‍යාපෘතිය අසාර්ථකත්වයට පත්වීමේ ඉඩකඩක් ඇති බැවින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමේදී නාගරිකව සිදුවන පරිසර බලපෑම බාධාවක් යැයි කරුණු ඉස්මතු වී ඇති බැවින් ප්‍රිමික්ස් අංගනය ගල්ලෙපිට ආදාහනාගාර භූමියේ ඉදි කිරීම අනතුරුදායක බව පෙනී යයි.එබැවින් මෙම ව්‍යාපෘතිය කෙටෙතැන්න කසළ කළමණාකරණ අංගනය පිහිටි භූමියේ ඉදි කිරීම වඩාත් යෝග්‍යය බැවින් මහා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගල්ලෙපිට ආදාහනාගාර භූමිය වෙනත් කාර්යයකට යොදවා ගැනීමට නොහැකි ලෙස පවරා දුන්නත්,ඒ පරම්පරාවේ කවුරුහරි දැන් ඉන්නවානම් එයාගෙන් අනුමැතියක් ලබා ගැනීමට හැකි නම් ඒ කාර්යය එතන සිදු කළ හැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මෙය දිගින් දිගටම සාකච්ඡා වුන බවත්,නිලධාරීන් තව එකක් කියනවා,භූමියේ වටිනාකම් පැත්තෙන් තව එකක් කියනවා,ඔය කියන කාරණා සියලු දේ කමිටුවෙන් සාකච්ඡා කර අවසන් තීන්දුවකට පැමිණිය බවත්,මෙම කාර්යය සඳහා මුදල් පැමිණ ඇති බවත්,මෙය දිගින් දිගටම ඇද්දොත් කොහෙන්වත් පටන් ගැනීමට නොහැකි බවත්,අවසානයේ සභාවට යොමු කර තීරණයක් ගැනීමට යොමු කළ යුතු බවත්, වාද විවාද කිරීමෙන් පළක් නොමැති බවත්,මෙම කාර්යය ඉක්මනින් සිදු කළ යුතු බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

සුසාන භූමි සඳහා වෙන් කොට තිබුණද පසුව සුසාන භූමියක් ලෙස භාවිතා නොකරන ලද ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතියෙන් තොරව විකිණීම,මනාපයක් කිරීම හෝ සෙසු කිසිම කාර්යයක් කිරීම තහනම් බවද,සුසාන භූමි ආඥා පනත යටතේ ඒවා වෙනත් කාර්යයකට යෙදවීම නීති විරෝධී බැවින් ,පසුව මුදල් යොදවා සකස් කර පසුව කඩන්න කිවහොත් ගැටළුවක් වන හෙයින් කසළ මධ්‍යස්ථානයේ මෙම සංවර්ධනය සිදු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 03**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රිමික්ස් අංගනය ඉදි කිරිමේ ව්‍යාපෘතිය කෙටෙතැන්න කසළ කළමණාකරණ අංගනය පිහිටි භූමියේ ඉදි කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව.11.25ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

04.ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය,පනාවැන්න පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික (NVQ 4) පරිගණක පාඨමාලාව හදාරා අවසන් කර ඇති ගොඩගම,පාතකඩ ලිපිනයෙහි පදිංචි පී.ඩී.ටී.කේ.ලක්ෂාණි මෙය අප ආයතනයේ මාස 06ක පරිගණක ක්ෂේත්‍රයේ වැඩිපුර පුහුණු අවස්ථාවක් ලබාගැනිම සඳහා කරනු ලබන ඉල්ලීම හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(II) ප්‍රකාරව දිනකට රු.1000.00ක මුදලක් ගෙවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 04**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය,පනාවැන්න පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික (NVQ 4) පරිගණක පාඨමාලාව හදාරා අවසන් කර ඇති ගොඩගම,පාතකඩ ලිපිනයෙහි පදිංචි පී.ඩී.ටී.කේ.ලක්ෂාණි මෙය අප ආයතනයේ මාස 06ක පරිගණක ක්ෂේත්‍රයේ වැඩිපුර පුහුණු අවස්ථාවක් ලබාගැනිම සඳහා කරනු ලබන ඉල්ලීම සළකා බලා ඇය වෙත පුහුණු අවස්ථාව සළසා දීමටත්,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(II) ප්‍රකාරව දිනකට රු.1000.00ක මුදලක් ගෙවිම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

05.2025.05.13 වන දින තීරණ අංක 02 යටතේ ලියාපදිංචි සැපයුම් කරුවන් ලේඛනය සංශෝධනය කිරීම- සේවා අවශ්‍යතාවය මත වාහන අලුත්වැඩියාව සඳහා නව සැපයුම් කරුවෙකු වන ඩබ්.පී.මෝටර්ස් ආයතනයේ ඩබ්.ජේමසිරි මහතා ඇතුලත් කර සැපයුම්කරුවන් ලේඛනය සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 05**

පහත සඳහන් සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් ලැයිස්තුව අනුමත කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මමත විය.

| අනු අංකය | ලියා පදිංචි අංකය | ආයතනයේ නම ලිපිනය | ලියාපදිංචි වන අයිතම අංකය හා විස්තරය | දුරකතන අංකය |
|---|---|---|---|---|
| 1 | 1.1 | රංගලේත් ඉංජිනියරින්,238/1,රත්නපුර පාර ,පැල්මඩුල්ල | 01.ට්‍රැක්ටර් රථ බැකෝ යන්ත්‍ර ඇතුළුව මෝටර් රථ වල සියලුම අලුත්වැඩියා කටයුතු(ඩීසල් පෙට්‍රල් වාහන)-ලියවන පට්ටල් වැඩ/වැල්ඩින් වැඩ | 071-7199115<br>075-2493856 |
| 2 | 1.2 | එල්.බී.ඩී.කේ.එන්.ඩී.සිල්වා,සොහොයුරෝ මෝටර්ස්,තැන්න,හල්ලින්න,ඕපනායක | 01.ට්‍රැක්ටර් රථ බැකෝ යන්ත්‍ර ඇතුළුව මෝටර් රථ වල සියලුම අලුත්වැඩියා කටයුතු(ඩීසල් පෙට්‍රල් වාහන) | 045-3451031<br>074-0732064<br>071-5911480 |
| 3 | 1.3 | ගාමිණි ඩීසල් මෝටර්ස්,අයි.ජී.ජේ.වීරසිරි,රක්වාන පාර,ගොඩම,පැල්මඩුල්ල | 01.ට්‍රැක්ටර් රථ බැකෝ යන්ත්‍ර ඇතුළුව මෝටර් රථ වල සියලුම අලුත්වැඩියා කටයුතු(ඩීසල් පෙට්‍රල් වාහන) | 045-2275025 |
| 4 | 1.4 | W.P.මෝටර්ස් දිප්පිටිගල,ලෙල්ලෝපිටිය | 01.ට්‍රැක්ටර් රථ බැකෝ යන්ත්‍ර ඇතුළුව මෝටර් රථ වල සියලුම අලුත්වැඩියා කටයුතු(ඩීසල් පෙට්‍රල් වාහන) | 071-7002641 |
| 5 | 2.1 | ඊ.ඒ.චතුර නාලක,ඉඹුල්තැන්න,උතුරු හුණුවල,ඕපනායක | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 077-0851440<br>071-1960920 |
| 6 | 2.2 | කේ.විමල් උදයකුමාර,81 ½ ,කට්ටංගේ පාර,කහවත්ත | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 076-2475224 |
| 7 | 2.3 | එස්.ආර්.එස්.කුමාර,දෙනවක වත්ත,පැල්මඩුල්ල | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 071-6465354 |
| 8 | 2.4 | එච්.පී.සුජිත් නිල්මිණි විජේසිංහ,සමගි මාවත,තලගහවත්ත,ලෙල්ලෝපිටිය | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 0713663322 |
| 9 | 2.5 | ආර්.එම්.සී.දිල්හානි,368/බී,රිල්හේන,පැල්මඩුල්ල | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 076-3185591<br>070-9472496 |
| 10 | 2.6 | යූ.එච්.සෙනරත්,නො.10 කොටස,සමනළ ගම,පාතකඩ,පැල්මඩුල්ල | 02.සියලු වර්ගයේ ගස් කැපීම | 071-1069214 |

06.ආණ්ඩුකාරලේකම්ගේ අංක GS/ES/06/14(1 )වෙළුම හා 2025.01.15 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇති පරිදී සභාවේ කසළ කළමණාකරණ කටයුතු සඳහා සේවා අවශ්‍යතාවය මත ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් මාස 03න් 03ට සේවා බණ්ධනය වන අන්දමින් සෞඛ්‍ය කම්කරුවන් 04 දෙනෙකු බඳවාගෙන ඇති අතර,එයින් දෙදෙනෙකු මේ වන විට සේවයට වාර්තා නොකරන බැවින් ඒ සඳහා ඉදිකැටිය,පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි චමින්ද කුමාර බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සෞඛ්‍ය කම්කරුවන්,රියදුරන්,මාර්ග කම්කරුවන් සේවයට නොපැමිණීමට හේතුව ලෙස මොවුන් පිළිබඳ ඇති සමාජ ආකල්පයයි.මොවුන් විශාල සේවයක් සිදු කරන බවත්,මොවුන් දැක්කහම පිලිකුල් සහගත බවක් සමාජය දරණ බවත්,මේ නිසා සමාජ පරිවර්තනයක් අවශ්‍යයි.මෙම සේවාවන් ගරු කටයුතු වෘත්තියක් බවට පත් කර ඔවුන්ට පුහුණුවක් ලබා දී,සුදුසු ඇඳුමක් ලබා දී ගරුත්වයක් හිමි කර දීමේ වැඩපිළිවෙලක් සභාවෙන් පටන් ගත යුතු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 06</u>**

සභාවේ කසළ කළමණාකරණ කටයුතු සඳහා සේවා අවශ්‍යතාවය මත ශ්‍රමය මිලදී ගැනීමේ පදනමින් මාස 03න් 03ට සේවා බණ්ඩනය වන අන්දමින් සෞඛ්‍ය කම්කරුවෙක් ලෙස ඉදිකැටිය,පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි චමින්ද කුමාර බඳවා ගැනීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**<u>II.ගරු උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා.</u>**

07.වැසි දින වලදී කොස්වත්ත බුලත්වැල්ගොඩ ඇතුලු ගම්මාන ගංවතුරට නිතරම යට වීම නිසා ජන ජීවිතයට බාධා සිදුව ඇත.එම නිසා ඊට බලපා ඇති හේතු සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෑත කාලීනව වැසි දිනවලදී බුලත්වැල්ගොඩ,කොස්වත්ත,ගුරුදොළ යන ගම්මාන පොඩි වැස්සකටත් යටවන බවත්,එම පවුල් 150ක පමණ ප්‍රමාණයක් නිතරම පීඩාවට පත්වෙනවා.මෙයට බලපා ඇත්තේ පසුගිය කාලයේ ඇදවැටුණු වර්ෂාවත් සමඟ ගස් කඩා වැටීම්,කොළ රොඩු හිරවීම්,කොටන් වැනි දේ ගන්කන්ද පාලමත් ඒ ආශ්‍රිත ඉවුරු වලත් රැඳී තිබීමයි.එහෙයින් ජලය ගලා යාමේ ප්‍රශ්නයක් ඇති බවත්,තවද පස් ගොඩ කිරීම් වැනි දෑද බලපා තිබේ.මෑත කාලයේදී පොඩි වැස්සට ගංවතුරින් යටවීමකට ලක් වෙනවා.මේ නිසා ජනතාව දැඩි අසීරුතාවයන්ට මුහුණ දේ.මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අංශයෙන් විමසීමක් සිදු කළ අවස්ථාවේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර විසඳුමකට යන බවයි.මේ සම්බන්ධයෙන් ඉක්මනින් පියවරක් ගත යුතු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 07</u>**

මෙම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

08.පහළ බෝපිටිය උඩකන්ද වත්ත මාර්ගයේ කොටසක් ගැලවීයාමේ අවදානමකට ලක්ව ඇත.එම කොටසට පැති බැම්මක් ඉදි කර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 08</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

09.කුට්ටපිටිය වසමේ තෙප්පුකොලම වැව අසළ පාලමේ ඇදි කැඩී ගොස් අනතුරුදායක තත්වයකට ලක්වී ඇති බැවින් එහි පැති බැම්ම සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

පාලමේ ඇදි දෙක බොහෝ අබළංවී ඇති බවත්,විශාල ගම්මානයකට යන පාලමක්,මොවුන්ගේ ජීවනෝපාය තේ දළු බැවින් විශාල වාහන ප්‍රමාණයක් ගමන් කරන බවත්,මෙම සංවර්ධනය සභාවට කළ නොහැකි නම් පළාත් සභාවට හරි යොමු කරන ලෙසත්,මෙය අනතුරු වැඩි ස්ථානයක් බවත්,මෙය සංවර්ධනය කර දෙන ලෙස ගම්වාසීන් ඉල්ලීමක් සිදු කර ඇති බවත්,පාලමේ ඇදි දෙක ඉක්මනින් සකස් කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව පළාත් සභාවට ඉදිරිපත් කර ඇති බවත්,ඉදිරියේදී මෙම සංවර්ධනය සිදු කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

සැලැස්මට අනුව කටයුතු කළ හොත් මෙම සංවර්ධනයන් ගොඩක් ප්‍රමාද වන බවත්,පසුගිය වර්ෂයේ සංවර්ධනයන් සඳහා රු.200,000.00ක් වෙන් කළ මුත් එය ලබා ගැනීමට නොහැකි වූ බවත්,මෙම වර්ෂයේදීවත් එම මුදල ලැබෙයි කියල බලාපොරොත්තු වන බවත්, සැලැස්මට අනුව සංවර්ධනයන් සිදු කිරීමට සිටියහොත් එය සාර්ථක වෙයි කියල විශ්වාසයක් නොමැති බවත්,මෙම කාර්යයන් ගොඩක් ප්‍රමාද වෙනවානම් අත්‍යවශය දේ පසුවට දැමීම සුදුසු නැති බවත් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව සැලැස්මකට නොව පළාත් සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

ගංවතුර අවධානම ගැන සාකච්ඡා කරන විට බුලත්වැල්ගොඩ පමණක් නොව පැල්මඩුල්ල විශාල ගංවතුර අවධානමකට ලක් වෙනවා.කෙටේතැන්න,පනාවැන්න යට වෙන බවත්,මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය

සම්බන්ධීකරණ කමිටුවේදීද ආපදා අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීමට යෝජනා කළ බවත්,බෝපැත්තෙ සිටම දෙනවක ගඟේ වතුර බැසයාම පිළිබඳව අවධානය යොමු කළ යුතුය.නගරය පිටුපස වතුර කාණුව පිවිසුම් මාර්ගය දක්වා ඒමට වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.පනාවැන්න ඇළ පළල් කිරීමට අවශ්‍යයයි.එවිට පනාවැන්න ගංවතුරින් යටවීමේ අවධානම අඩු කර ගත හැක.කෙටෙතැන්න යට වෙනවා.මේවාට දැන්ම ඉදන්ම සැලැස්මක් සැකසුවේ නැත්නම් ගංවතුර අවධානමට මුහුණ දීමට සිදුවේ.තාවකාලික පැලැස්තර නොව ආපදා සැලැස්ම සභාවෙන් යෝජනා කර ,සැලැස්මක් සකසා ක්‍රියාත්මක කළ යුතු බවත් මේ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකකරණ කමටුවට යොමු කරන ලෙසද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මෙම ජල ගැලීම් අදක ඊයෙක සිදු වුවක් නොවන බවත්,ආපදා සැලැස්මක් සකස් කළ යුතුය.අවශ්‍ය තැන් වලට බෝක්කු යෙදීමත්,බෝක්කු කටවල් විශාල කිරීමටත්,නැවත ඉදිකිරීම් සිදු කිරීමේදී නිසි අධීක්ෂණයක් යටතේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.රජය ලෙස කළු ගඟ ආශ්‍රිතව ව්‍යාපෘතියක් ගංවතුර පාලනය කිරීමට දියත් වන බවත්,මේ පිළිබඳවද අවධානය යොමු කරන බවද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි

මේ සම්බන්ධයෙන් කරුණු කාරණා ඉස්මතු වූ නිසා ලේකම්තුමා හා සාකච්ඡා කර සභාවේ සේවකයින් යොදවා ගඟ දෙපස ශුද්ධ කිරීමට කටයුතු කළත්,එහි ඇති අනතුරුදායක බව නිසා හා විෂය බාහිර නිසා එය සිදු නොකළ බවත්,ගඟට අවහිර වන පරිදි ගඟ දෙපස ඉදිකිරීම් ඇති බවත්,බුලත්වැල්ගොඩ ප්‍රදේශයට උතුරින් විශාල වෙල් යායක් පවතින බවත් මෙම වෙල්යාය ජලයෙන් යට වූ පසු විශාල ජල කඳක් එකතු වෙන බවත්,මෙම ගඟ දෙපස කොටන් වැනි දෑ හිරවීම හා ඉදිකිරීම් නිසා ගඟ අවහිර වන බවත්,මෙම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 09</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**<u>III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමාගේ යෝජනා.</u>**

10.පැල්වාඩිය සිට ගල්ලින්න දක්වා ප්‍රධාන මාර්ගයේ වළවල් සහිත බැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගල්ලින්න ගමට යන ප්‍රධාන මාර්ගය දැඩි ලෙස අබලංවී පවතින බවත්, පාසල් ළමුන් ප්‍රවාහනය කරන වාහන,එදානෙදි ගමනාගමනය වන වාහන විශාල ප්‍රමාණයක් මෙම මාර්ගය භාවිතා කරන බවත්,මෙය දැන් ගමනාගමනයට නොහැකි තත්වයකට පත්වී ඇති බවත්,කඩිනමින් පිළිසකර කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 10</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා වියදමින් සිදු කළ හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

11.ගොරකගහ හන්දියේ සිට නන්දතිස්ස මහතාගේ නිවෙස් දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 11</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා වියදමින් සිදු කළ හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

12.පතුල්පාන සුමිත් හෝටලය අසළින් යන මාර්ගයේ බෝක්කුවක් දමා ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 12</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා වියදමින් සිදු කළ හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

13.පැල්වාඩිය ගනේගම අතුකෝරළ මහතාගේ නිවෙස් දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 13</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභා වියදමින් සිදු කළ හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

14.පැල්වාඩිය බේරුකැටිය මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 14</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සභා වියදමින් සිදු කළ හැකි සංවර්ධනයක් නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති නම් අදාළ ආයතන වෙත දැනුම් දීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

15.පොල්ගහතැන්න චතුරංග මහතාගේ නිවෙස් මාර්ගය බැකෝ කර සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 15</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වෙරංජා කාමනී විජේරත්න මැතිතුමියගේ යෝජනා.</u>**

16.සර්වෝදය මාවතේ සිට සමගි මාවත දක්වා තිබෙන අඩි 08න් යුත් මීටර් 150ක් දුර පාරෙහි නිවෙස් 10ක් පමණ ඇත.මෙම මාර්ගය විශාල පිරිසක් භාවිතා කරන බැවින් මාර්ගය බොහෝ සෙයින් අබලංවී ඇත.මීට පෙර කිහිප වරක් ඉල්ලීම් කළ නමුත් ඒවාට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.මෙම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වසම හරහා සිදු කළ යුතු යෝජනා VDP හරහා ප්‍රමුඛතාවය මත සිදු කරන බවත්,ඒ හරහා සිදු කිරීමේදී ප්‍රමාදයක් වන බවත්,නිවෙස් වැඩිම මාර්ග ප්‍රමුඛතා ගත කර ගෙන යන බවත් මෙම යෝජනාවද ඉදිරියේදී කළ හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා පවසන ලදි.

මෙම මාර්ගය ළහිරු මාවත බවත්,පහළ බෝපිටිය මායිමේ තිබෙන බවත්,මෙය පහළ බෝපිටිය හරහා සර්වෝදයට යන කෙටිම මාර්ගය බවත්,මෙම මාර්ගය ළහිරු යෞවන සමාජයෙන් ශ්‍රමදාන මට්ටමින් සකස් කළ මාර්ගයක් බවත්,මෙම යෝජනාව හොඳ යෝජනාවක් බවත්,සභාවේ බැකෝ එක හරි භාවිතා කරල ගල් ටිකක් හරි දාලා දැනට යන්න පුළුවන් විදියට හදල දෙන්න පුළුවන්නම් හොඳ දෙයක් බවත් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි

**<u>තීරණ අංක 16</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත බැකෝ යන්ත්‍රය යොදා මෙම මාර්ගය සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

17.2026.05.13 තීරණ අංක 09 ට අනුව පරිසර හා පොදු පහසුකම් කමිටුව හරහා ලබා ගත් නිර්දේශ අංක 04 යටතේ,

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ජේ.එන්.ජී.ලක්මිණ,ඩබ්.සුමිත් යන දෙදෙනාගේ සේවා කාලය මාස 03කින් දීර්ඝ කර එම කාලය තුළ අධීක්ෂණ කටයුතු සිදු කර එහි ප්‍රගතිය මත ඉදිරියේදී සේවා කාලය දීර්ඝ කරනාවාද නැද්ද යන්න තීරණය කිරීමත්,ඒ.උදය කුමාර,ආර්.උදය කුමාර යන දෙදෙනාගේ පැමිණීම සතුටුදායක නොවන බැවින් ඔවුන් සේවය හැර ගියා සේ සළකා එම තනතුරු වලට සුදුසුකම්ලත් වෙනත් දෙදෙනෙකු බඳවා ගැනීමට කමිටු සාමාජිකයින්ගේ නිර්දේශය හිමි විය.ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පෞද්ගලික යෝජනාවක් නොවන බවත්, 2026.05.13 තීරණ අංක 09 ට අනුව පරිසර හා පොදු පහසුකම් කමිටුවට ලබා දුන් වගකීම ඉෂ්ඨ කළ බවත්,සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිහිපයක් කමිටු වාර්තාවේ ඇතුලත් කර ඇති බැවින් මෙම වාර්තාව කියවන ලෙස ගරු සභාවෙන් ඉල්ලීමක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා සිදු කරන ලදි.

**<u>තීරණ අංක 17</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ජේ.එන්.ජී.ලක්මිණ,ඩබ්.සුමිත් යන දෙදෙනාගේ සේවා කාලය මාස 03කින් දීර්ඝ කිරීමටත්,සෞඛ්‍ය කම්කරු තනතුරු 02 සඳහා බඳවා ගැනීම සිදු කිරීමත් සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

## VI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.

18.ගල් අස්සාපොළ ,කන්දෙඅරඹ මාර්ගයේ පසුගිය දිනවල පැවති වර්ෂාව නිසා කාණුවට වැටී ඇති පස් ඉවත් කර කාණුව සැකසීමට JCB යන්ත්‍රය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 18**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

19.බුදුලෙන අක්කර 30මාර්ගයේ ස්ථාන කිහිපයකට වැටී ඇති පස් ඉවත් කර කාණුව සැකසීමට JCB යන්ත්‍රය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 19**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

20.බුදුලෙන පෙර පාසල සඳහා නම සඳහන් නාම පුවරුවක් සකසා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 20**

මෙම යෝජනාව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පූර්ව ළමාවිය සංවර්ධන අංශය වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

21.උඩදළුව කෝවිල පාරේ වැටී ඇති පස් ඉවත්කර කාණුව සැකසීමට කාණුව සැකසීමට JCB යන්ත්‍රය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 21**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

22.2025.12.10 වන දින තීරණ අංක 20 යටතේ ලබා ගත් පහත යෝජනාව හා තීරණය
බලපත්‍රධාරී ඩබ්.බී.එම් හිරුණි නවෝද්‍යා බස්නායක මියට අයත් පතලෙන් ගල්ලෙපිට ආදාහනාගාරය පිහිටි ඉඩමට කණින ලද දෝනාවෙන් හමු වූ මැණික් ඛණිජ පාෂාණ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කිරීම.

තීරණ අංක 20
මෙම ඉඩමෙන් හමු වූ මැණික් ඛණිජ පාෂාණ සම්බන්ධයෙන් අපරාධ විමර්ෂණ දෙපාර්තවේන්තුව වෙත පැමිණිල්ලක් ගොනු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත්, ආරම්භයක් ලෙස අපරාධ සම්බන්ධ විශේෂඥ දැනුම ඇති නීතිඥ වරයෙකුට ගොනුව ඉදිරිපත් කර නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සාක්ෂි ඇත්දැයි පරීක්ෂා කර බලා ලැබෙන වාර්තාව මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය

මෙම තීරණයට අදාළව මේ වන තෙක් කිසිදු ප්‍රගතියක් (මාස 06ක්)ලබා දී නොමැති බැවින් මීට අදාළ සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු මහා සභාවට ඉදිරිපත් කරමි(2026.05.29 කාර්මික හා සේවා කමිටු නිර්දේශ අංක 06)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සභාවේ ඒකමතිකව තීරණයක් ගත් අතර,නමුත් වැඩකටයුතු බහුල වීම හේතුවෙන් මෙම කටයුතු සොයාබැලීමට සිදු නොවූ බවත්,කඩිනමින් ඊළඟ සභා වාරයට පෙර නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

මේ සම්බන්ධයෙන් පරීක්ෂණ ගාස්තු ලෙස රු.200,000.00 මුදලක් වැය වන බව භූ විද්‍යා එකෙන් දැන්වූ බවත්, පරීක්ෂණයට යන බිල ඉදිරිපත් කරන ලෙස දැන්වූ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

භූ විද්‍යා එකෙන් මෙම කටයුතු සිදු වන විට ප්‍රමාදයක් සිදු වන බැවින් සෝදිසි වළවල් බසින ලෙස ප්‍රකාශ කළ බවත්,එදා දෙකම සභාව අනුමත කළා.බැකෝ යන්ත්‍රයක් යොදා කැඩීමක් සිදු කළ නොහැකි බවත්,ආදාහනාගාරයට

විනාශයක් වුවොත් කව්ද වගකීමක් ගන්නෙ,මැණික් සංස්ථාවේ අවසරය අරගෙන සෝදිසි වළවල් බහින ක්‍රමවේදයක් ඇති බවත්,ඒ ක්‍රමවේදයට යාමට උත්සහ කළ බවත්,මෙම කාර්යයන් දෙකම සිදු නොවූ බවත් තවද සභා දේපළක් ආරක්ෂා වනවානම් 100%ක් ඔබතුමන්ලා සමඟ සිටින බවත්,දැන් භූමියට දෝනා ගමන් කර නොමැති බවට සහතිකයක් දෙනවනම් ඒ සහතිකය පිළිගැනීමට කැමති බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

ගිය දෝනා වලට වළවල් බැස මිනුමක් කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්,දැනට වළවල් බැස්ස බවත්, රු.80,000.00 ක දඩයක් නියම කළ බවත්,නැවත නැවත පරීක්ෂණ සිදු කළ හැකි බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

සුසාන භූමි ආඥා පනත යටතේ මැණික් වෙනමම පරස්පර කටයුත්තක් බවත්,අමාත්‍ය වරයාගේ අවසරය ලබා ගත යුතු බවත්,දැනට මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙසට භූ විද්‍යා දෙපාර්තමේන්තුව ලිපියක් යොමු කළ බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 22</u>**

මෙම ගැටළුව සම්බන්ධයෙන් කඩිනමින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**<u>VII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

23.දිප්පිටිගල විද්‍යාලය අසල ඇති අජිත් මහතාගේ නිවස දක්වා ඇති අතුරු මාර්ගය මීටර 125ක් පමණ කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 23</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.
24.දිප්පිටිගල ප්‍රජා ශාලාව අසළින් ඉහළ මාර්ගයේ සුජීව මහතාගේ නිවස දක්වා මාර්ගයේ කඩතොළු වී ඇති මාර්ගය සංවර්ධන කටයුතු සිදු කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 24</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

න්‍යාය පත්‍රය යොමු කිරීමෙන් පසු පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මඟින් ගල්ලෙපිටහේන ඉඩමේ අනවසර පදිංචි පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම යන මැයෙන් එවා ඇති ලිපිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීම අත්‍යවශ්‍ය හෙයින් හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට මහා සභාවෙන් එකඟතාවය විමසීය.පොදු එකඟතාවය මත හදිසි යෝජනාව ඉදිරිපත් කරන ලදි.

**හදිසි යෝජනා.**

**<u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

ගල්ලෙපිටහේන ඉඩමේ අනවසර පදිංචි පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG/06/01/04/03 හා 2026.05.25 දිනැති ලිපියට අනුව ගල්ලෙපිට ආදාහනාගාර ඉඩම එම කටයුතු සඳහා අවශ්‍ය නොවන්නේ නම් හා පළාත් පාලන දෙපාර්තමේන්තුවට පවරා ගෙන ඇත්නම් ,අනවසර පදිංචි පුද්ගලයන් වෙත බෙදා දීම සඳහා විධිමත් පරිදි ප්‍රාදේශීය ලේකම් වෙත ආපසු භාර දීම සුදුසු බවට කර ඇති නිර්දේශ අනුව ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/6/14/3(II) වෙළුම 7 හා 2026.03.17 ලිපියෙන් ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇති බවත්,මේ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප.ව.12.00ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය සභාවෙන් පිටවන ලදි.

ප.ව.12.00ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතුතුමා සභාවට පැමිණෙන ලදි.

මෙම අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් පතා ලිපියක් යොමු කළ බවත්,නමුත් ඔවුන් වටහාගෙන ඇත්තේ මෙම ඉඩම අනවශ්‍ය බවත්,එයාලට ඉඩම පවරා දෙනවනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉඩම පවරා දෙන ලෙසයි.ඉන් පසු ඔවුන් ඉඩම් කච්චේරියක් පවත්වා සුදුසු පරිදි කටයුතු කරන බවත්,ඒ අනුව එම ලිපිය අනුව ගල්ලෙපිටහේන ආදාහනාගාර ඉඩම එම කටයුතු සඳහා අවශ්‍ය නොවන්නේ නම් හා

පළාත් පාලන දෙපාර්තමේන්තුවට පවරා ගෙන ඇත්නම් ,අනවසර පුද්ගලයන් වෙත බෙදා දීම සඳහා විධිමත් පරිදි ප්‍රාදේශිය ලේකම් වෙත ආපසු භාර දීම සුදුසු බවයි.වැරදි වැටහීමක් සිදු වී ඇති බවත් අපට අවශ්‍ය වූයේ අනවසර පදිංචි කරුවන් වෙනුවෙන් ගත යුතු නීතිමය තත්වය සම්බන්ධයෙන් මඟ පෙන්වීමක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බවත් ,ඔවුන් මුළු ඉඩම සම්බන්ධයෙන් මෙසේ ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්,මෙම ගැටළුව නිවැරදි කර නැවත ලිපියක් යොමු කරන බව ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 25**

මෙම භූමියෙහි ආදාහනාගාරය පිහිටා ඇති හෙයින් වෙනත් ආයතනයකට ලබා දීම කෙරෙහි එකඟතාවයක් නොමැති බවත්,මෙම භූමියෙහි කොටසක පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් සඳහා සභාව මඟින් බදු දීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

වැටුප් ප්‍රමාණවත් නැහැ කියල අත්දැකීමෙන්ම තේරුම් අරන් ප්‍රකාශයක් සිදු කර අවශ්‍ය අයගේ අවධානයට යොමු කර පළාත් පාලන මන්ත්‍රීවරුන් වෙනුවෙන් මීට වඩා දීමනාවක් ලැබිය යුතුයි කියල ලිපියක් යොමු කරනව කියපු ප්‍රකාශයට ප්‍රසාදය පළ කරන අතර,පුළුවන්නම් ඉන්ධන දීමනා ගමන් වියදම් දීමනා ලබා ගැනීමට ක්‍රමවේදයක් සලසන ලෙසත්, මන්ත්‍රීවරුන් දේශපාලනය කරන විට අප ජනතාවට කැප වන විට ලොකු ආර්ථික ශක්තියක් තිබෙන අය නොවන බවත්,දේශපාලනය කරන විට අපි අවංකව හදවතට එකඟව කිරීමට පහසුකම් සලසා දිය යුතුය.ජනතාවට සේවය කිරීමට පහසුකම් අවශ්‍යයි.පහසුකම් පිළිබඳ වපර ඇහින් බලන්නැතිව අපි හැමෝම එකතු වී ජනතාවට සේවය කළ යුතුය.මන්ත්‍රීවරුන්ගේ අපහසුතා පිළිබඳ අවධානය යොමු කර එවැනි ඉල්ලීමක් කරන ලෙසත්,මෙයින් අපවාදයක් ආවත් හදවතට එකඟව සමස්ථ ලංකාවම ඉන්න පළාත් පාලන මන්ත්‍රීවරුන් වෙනුවෙන් අවධානයට ලක් කිරීම අගය කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මේ සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත යොමු කිරීමටත්,මෙම ගමන් වියදම් ලබා ගැනීම සම්බන්ධයෙන් වැටුප් විෂය නිලධාරී උපනන්ද මහතාගෙන් සහය ලබා ගත හැකි බව ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

උපනන්ද මහතාගෙන් උදව් ගන්න පුළුවන්නම් වටින බවත්,සභාවේ මන්ත්‍රීවරුන් රැඳී සිටියි කියා විශ්වාසයක් නොමැති බවත්,දැනටම මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු ඉල්ලා අස්වීමට සාදන බවත්,සියලුම මන්ත්‍රීවරුන් සභාවේ රැඳී සිටිනවානම් කැමති බවත් ගරු උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

ගම රට හදන්න අපි මෙතනට පැමිණියේ වෙනත් ආර්ථික කටයුත්තක් සිදු කරමින් බවත්,ඡන්දයට ඉදිරිපත් වී මොනවහරි දෙයක් කිරීමට හැකිමෙන් කතා කරන බවත්,මේ ආණ්ඩුවෙන් නැති කළ දෙයක් නෙවෙයි මෙය කලින් ඉඳන්ම තිබ්බව දෙයක් බවත්,නීති විරෝධීව යමක් කිරීමට නොහැකි බවත්,නීත්‍යානුකූල තත්වය මත ගලප්පා ඇති බවත්,ඉස්සර වගේ කොන්ත්‍රාත් එහෙමත් නොමැති බවත් ඒවා විනිවිද භාවයෙන් සිදු වන බවත්,සමහර අයට ඒ මත යැපීමට නොහැකි බවත්,ඉල්ලා අස්වූ මන්ත්‍රීවරයා දීමනා මත නොව පෞද්ගලික ව්‍යාපාර හා රැකියාව වෙනුවෙන් ඉල්ලා අස්වූ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ගම් සභා කාලයේ මෙන්ම දැන්ද ගරු සේවයක් බවත්,ගරු සේවයක් කළාට සුසන්ත මන්ත්‍රීතුමා පැවසුව දැන් කොන්ත්‍රාත් නැහැනෙ කියල,මෙම කථාව හැමෝටම අදාළ නොමැති බවත්,කොන්ත්‍රාත් වලින් ගත් මිනිස්සු ඇති චෝදනාවක් ලෙස මුළු සභාවක් ඉදිරිපිට කිවයුතු නැත යනුවෙන් හා අප මෙතනට පැමිණියේ ගරු සේවාවක් කිරීමට බවත් දැන් වන විට මන්ත්‍රීවරයෙකුට ගරු කියන තත්වය කොතනද තියෙන්නේ එදා තිබුණ දේ නැත්තට නැතිවී තිබෙන බවත්,මෙම දීමනාව වැඩි කරන්න කියන්නෙ පවුල රකින්න නොව ජනතාවට සේවය කිරීමට බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසන ලදි.

ගරු පුෂ්පකුමාර ධනසේකර මැතිතුමාට අපහාසයක් වන නිසා මෙම ප්‍රකාශය සිදු කරන බවත්,එතුමා ඉල්ලා අස්වූයේ මුදල් නිසා නොවන බවත්,ඔහු ඉංජිනේරුවරයෙක් බවත්,එතුමාගේ සේවය මෙතන රඳවා ගැනීම අපරාධයක් බවත්,එතුමා වෙනත් කටයුත්තක් වෙනුවෙන් සූදානම් වී ඇති බැවින් ඔහු ඉල්ලා අස්වූ බව ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2026.05.05 දින පැවති ආපදා කළමනාකරණ කමිටු වාර්තාව හා 2026.05.20 දින පැවති පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව 2026.05.22 හා2026.05.29 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව සභාගත කරන ලදි.

ආපදා කළමණාකරණ කමිටුව සඳහා අවම වශයෙන් ඔබ ප්‍රදේශයෙන් සුදුසු එක් පුද්ගලයෙකුවත් සම්බන්ධ කරන ලෙස ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

සභාවට යෝජනාවක් කර කියා සිටිය ගම් මට්ටමින් කසළ කළමණාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ අවස්ථාව සලසා දෙන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලීමක් සිදු කළ බවත්,මෙතෙක් මේ කටයුත්ත සඳහා කාගෙන්වත් සහයෝගයක් නොලැබුණ බවත්,මිනිසුන් දැනුවත් කරන්නැතිව කසළ කළමනාකරණ කටයුත්ත සිදු කිරීමට නොහැකි බවත්,නැවත වාරයක් මතක් කිරීමක් ලෙස මෙම කටයුත්තට සහයෝගය ලබා දෙන ලෙසත්,මෙය හැමෝගෙම සභාව බවත්,මෙම කසළ ප්‍රශ්නයට විසඳුම් සෙවීමට අපි හැමෝම එකමුතු විය යුතු බවත්,මේ සඳහා ප්‍රජාව එකතුකරල එකතැනකට රැස් කර,කසළ කළමණාකරණය පිළිබඳ ජනගත කිරීමට සහයෝගය දක්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

මෙම කමිටු වලදී ගැටළු සාකච්ඡා කළා විතරයි ඒවා ක්‍රියාත්මක වන බවක් පෙනෙන්ට නොමැති බවත් මේවා කලේ නෑ කියල කමිටු වලට දෝෂාරෝපණ එල්ල වන බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා පවසන ලදි.

විශේෂයෙන්ම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කමිටු පවත්වන බවත්,විපක්ෂ මන්ත්‍රීවරු බොහෝ දෙනෙකු එනවා අඩු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

මෙම කමිටු වලින් ගන්නා ලද තීරණ වල ප්‍රශ්න ඇති බවත්,වීදි පහන් අක්‍රීය වීම පිළිබඳ ප්‍රජා සංවර්ධන කමිටුවෙන් තොරතුරු ගන්නා ලෙස සඳහන් වී ඇති බවත්,එහි ප්‍රශ්නයක් නොමැති බවත්,ගමට අදාළ මන්ත්‍රීවරයෙකු සිටින හෙයින් එතුමාගෙන් මේ සඳහා අදහස් ගත යුතුය.බෝපිටිය කොට්ඨාශයේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන බවත්,සමහරු අනවශ්‍ය දේ සිදු කරන බවත්, ඔවුන්ට රිසි පරිදි වීදි ලාම්පු සවි කරන බවත්,මේ අනිසි ක්‍රියාකාරකම් නිසා සභාවේ අපි අතර ඇති සමඟිය නැති වන බවත්,අනවශ්‍ය ලෙස ඇඟිලි ගැසීම් සිදු වනවාට කැමති නැති බවත්,

ගරු උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනා වල වරදක් නොදකින බවත්,ප්‍රාදේශීය සභාව මඟින් ගමක වීදි ලාම්පු පෙළගැස්විය යුත්තේ කෙසේද යන්න නිර්ණායක ලබා දෙන බවත්,ප්‍රජා ශක්ති කමිටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි බවත්,ගමේ සිටින නිලධාරීන් 04 දෙනාම සිටින බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

රජයන් විදියට ප්‍රතිපත්ති ගන්නා බවත්,කලින් ආණ්ඩුවේදී ග්‍රාමීය කමිටු පැවති බවත්,ඒවාට ගමේ නියෝජිතයින් සිටි බවත්,එකේ අඩුපාඩු දිහා බලා ප්‍රජා ශක්ති කමිටුව සාදා ඇති බවත්,එහි අඩුපාඩුව ලෙස ග්‍රාමීය කමිටුවේ තීන්දු කළද, ග්‍රාමීය සංවර්ධන කමිටුවෙන් සියලු දෙනා එකතු වී සැලැස්මක් සැදුවද ඒ ඒ අමාත්‍යාංශ වලින් වෙන වෙන වැඩ කරනවා.මේ ප්‍රජා සංවර්ධන කමිටුවට ගමේ මන්ත්‍රීවරයාටද සහභාගී විය හැකි බවත්,ලාම්පු සම්බන්ධව පොදු නිර්ණායක ටිකක් අනුව ප්‍රමුඛතාවය මත ලාම්පු සවි කරන බවත් එවිට කියන ආකාරයේ පුද්ගලයෝ සිටිනම් ඒගොල්ලන්ට ඕනි දෙයක් කිරීමට නොහැකි බවත්,රජය ගත්ත ප්‍රතිපත්ති ,ප්‍රතිපත්තිමය විදියට සැකසූ ප්‍රතිපත්තිමය සැලසුම් ලෙස ක්‍රියාත්මක වන බවත්,දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටුවේ හා ජාතික වශයෙන් ක්‍රියාත්මක වැඩසටහනක් බවත්,පක්ෂ දේශපාලනයෙන් තොරව ප්‍රජා සංවර්ධන කමිටුවට සකසා ඇති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ප්‍රජා ශක්ති කමිටුව හා අනෙකුත් කමිටු,සමිති සමාගම්,නිලධාරීන් හරහා පෙළගැස්වීමක් කළාට කමක් නැති බවත්,කොට්ඨාශයෙන් ජයග්‍රහණය කළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු සිටිනවා.එම ප්‍රජාශක්ති කමිටුවට විපක්ෂයේ මන්ත්‍රීවරු නොමැති බවත්,අප සියලු දෙනාම කරන්නේ දේශපාලනය බවත්,සාධාරණ ඉල්ලීමක් ලෙස සභාවෙන් යන ප්‍රතිපාදන වලට ඒ ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාව දැනුවත් කළ යුතු බවත්,ඔබතුමන්ලාට ඕන තරම් රජයේ ආධාර එන බවත්, ඒවා ගමට ගිහින් කළාට ගැටළුවක් නොමැති බවත් නමුත් සභාවෙන් එන ප්‍රතිපාදන එනකොට ගමේ මන්ත්‍රීවරයා දැනුවත් කළ යුතුය.මෙය සිදු විය යුතු බවත්,එයින් දේශපාලන වශයෙන් අවාසියක් නොවන බවත්,මන්ත්‍රීවරයා කොට්ඨාශයේ සිටියදී සභාවෙන් යන ප්‍රතිපාදනයන් එයා දැනුවත් නොමැති නම්,එය ශෝචනීය තත්වයක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට වීදි පහන් ලබා දීමට ඇති බවත්,ප්‍රතිපාදන තත්වය සැලකිල්ලට ගෙන වීදි පහන් මිලදීගෙන ග්‍රාම නිලධාරී වසමක් ආවරණය වන පරිදී වීදි පහන් සවි වීමක් වන බවත් එම අවස්ථාවේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට සහභාගී විය හැකි බවත්,එවිට ගැටලු මතු නොවන බවත්,ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

කලින් වීදි පහන් නොලැබුණ බවත්,නමුත් දැන් වීදි පහන් ප්‍රමාණයක් ලැබුණ බවත්,සභාපතිතුමා හා කාර්යය මණ්ඩලයේ ඒ සම්බන්ධ නිලධාරිතුමිය දුරකතනයෙන් දැනුම්දුන් බවත් ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත්,විශේෂයෙන් ඒ අවස්ථාවට සම්බන්ධ වූ රියදුරු ඇතුළු එම නිලධාරීන්ට ස්තුතිය පුද කරන ලදි.එම වර්ෂාවේද ජීවිත අවදානම නොතකා විදුලි කාර්මික මහතා විදුලි පහන් සවි කර බවත්,නිලධාරිතුමිය,රියදුරු,විදුලි කාර්මික මහතා ඒ අවස්ථාවේ විශාල සේවාවක් කළ බවත්,සියලු දෙනාට ස්තුතිය පළ කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

අත්‍යාවශ්‍ය නොවන තැන්වල විදි පහන් සවි කිරීමට නොහැකි බවත්,මෙතෙක් බල්බ් 749 ගෙනා බවත්,එම 749 සවි කිරීමෙන් පසුවද ප්‍රශ්න ඇති බවත්,ඉදිරියට ගත්තත් ප්‍රශ්න බවත්,බල්බ් 10 දෙන එක අවසන් කර එක තැනකින් පටන් ගෙන සවි කිරීමටත්,එවිට කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දැනුවත් කිරීමටත්,සියලු දෙනාම එකතු වී නිර්ණායක සැකසීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

නිර්ණායක සකස් කර තොරතුරු ගත්තට කමක් නැති බවත්,මේ සියලු විදි පහන් සවි කර ඇත්තේ අත්‍යවශ්‍යම ස්ථාන වලට බවත්,අත්‍යවශ්‍යම නොවන තැන් වල සවි කර ඇතිනම් ඒවා ගැළවීම සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බවත්,මන්ත්‍රීවරයෙකුගේ අභිමානය රැකෙන පරිදී කොට්ඨාශයේ වැඩ කිරීමට හැකියාව තිබිය යුතුය.අප සියලු දෙනාම එකතුවෙලා පොදු එකඟතාවයකට මේ වැඩපිළිවෙල හදා ගමු යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

ආපදාවකදී පෙර සූදානමක් ලෙස ජල බවුසර් සූදානම් කරගමු යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

දැනට තිබෙන්නේ එක බවුසරයක් බැවින් ,යෝජනාවක් ලෙස ජල ටැංකි ටිකක් ලබා ගැනීම සුදුසු බවත්,එවිට ටැංකි අවශ්‍ය ස්ථානයේ තබා බවුසරයෙන් ගොස් වතුර පිරවීමට හැකි බවත්,ටැංකි තිබීමට ස්ථාන හඳුනා ගත යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

විගණන වාර්තාව සම්බන්ධයෙන් පොදුවේ ගත් කළ සෑහීමකට පත් විය හැකි බව සඳහන් වන බවත්,තත්වාගණනය කළ වාර්තාවක් බවත්,මේකෙ අඩුපාඩු ගොඩක් කියල ඇති බවත්,එහි එකක් ලෙස දීර්ඝ කාලීනව ඉදිරියට ගෙන ඇති ගිණුම් විෂයන් 03කට අයත් රු.4,159,491.00 ක ශේෂ අනුමැතියෙන් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.අදාළ විදියට ඒ වැඩය වී නොමැති බවත්,2025.12.31 දිනට ලැබිය යුතු කර්මාන්ත ආධාර රු.27,536,409.00ක් ලැබිය යුතු කර්මාන්ත ආධාර ගිණුමට හර කර තිබූ නමුත් ප්‍රාග්ධන ආධාර 3-81 ගිණුමට බැර නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි යනුවෙනි.කරුණු 02ක් පමණක් සභාවේ අවධානය ට යොමු කළ අතර,මේවා ගැන වඩාත් සැලකිළිමත් විය යුතු බවත්,මුදල් කමිටුවේදී මෙය සාකච්ඡාවට බඳුන්කරමු යනුවෙන් හා එම වාර්තාවේ 03 වන පිටුවේ 1.3 සභාව ඉදිරියේදී කියවන ලදි.තවද මේ පිළිබඳ අවබෝධයක් මුදල කමිටුවට තිබිය යුතු බවත්,පොත් පත් හරියට සටහන් වනවාද?එහි වියදම් විනිවිද භාවයක් තිබෙනවාද ,පිළිගත් මට්ටමක ගිණුම්ගත වනවාද යන්නත් සොයා බැලීමක් කළ යුතු බව යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

2026.04.01 සිට 2026.04.30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**
- **සභාපතිතුමාගේ ස්තුති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් ,විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට , මාධ්‍යවේදී මහතාටද ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.1.05 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ගරු ප්‍රාදේශීය සභා ................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-07-08 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව